④

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1669/25 2010 සැප්තැම්බර් 03 වැනි සිකුරාදා - 2010.09.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1982 අංක 6 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත

1982 අංක 6 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනතේ 31 වැනි වගන්තිය යටතේ ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

කෙහෙළිය රඹුක්වැල්ල,
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍ය.

2010 අගෝස්තු මස 21 වැනි දින,
කොළඹ,
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ දී ය.

නියෝග

1. මෙම නියෝග 2010 පෞද්ගලික රූපවාහිනී විකාශන මධ්‍යස්ථාන නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර, එම නියෝග මෙහි මින්මතු නිකුත් කරනු ලබන බලපත්‍ර සඳහා අදාළ වේ. ඒ අනුව 2008.10.10 වැනි දින අංක 1570/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 2007 පෞද්ගලික රූපවාහිනී විකාශන මධ්‍යස්ථාන නියෝග, 2009.10.27 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

වර්ගීකරණය

2. පෞද්ගලික රූපවාහිනී විකාශන මධ්‍යස්ථාන, පහත දැක්වෙන පදනම මත වර්ගීකරණය කරනු ලැබේ:-
   (අ) රූපවාහිනී නරඹන්නන් වෙත ප්‍රවේශ වීම සඳහා භාවිත කරනු ලබන තාක්ෂණය මත -
      (i) ඇනලොග්, (ප්‍රතිසම) ; සහ
      (ii) ඩිජිටල් (සංඛ්‍යාත)
   (ආ) නරඹන්නා අනුව -
      (i) විකාශන නැරඹීම සඳහා යම් කාලසීමාවකට දායක මුදලක් ගෙවීම
      (ii) විකාශනය නැරඹීම සඳහා යම් කාලසීමාවකට දායක මුදලක් නොගෙවීම
   (ඇ) විකාශන ප්‍රේෂණය කිරීමට භාවිතා කරන්නා වූ යටිතල පහසුකම් අනුව -
      (i) බලපත්‍රලාභියාට අයත්
      (ii) වෙනත් බලපත්‍රලාභියකුට අයත්

3. බලපත්‍රයක් ලබාගැනීම සඳහා ඉල්ලීමක් කරනු ලබන යම් තැනැත්තකු විසින්, පහත දැක්වෙන තාක්ෂණික,මූල්‍ය හා වෘත්තීමය ප්‍රභේද යටතේ ඉල්ලා ඇති තොරතුරු සහිතව, අමාත්‍යවරයා වෙත ලිඛිතව ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතුය.

1A - G 13361 — 530 (2010/09)

### තාක්ෂණික

4. අයදුම්කරු විසින් යෝජිත විකාශන මෙහෙයුම් කටයුතු සම්බන්ධ තාක්ෂණික විස්තර ඉදිරිපත් කළ යුතුය.

(අ) ශ්‍රී ලංකාව තුළ, අන්තර්ජාලය මත පදනම් වූ හෝ දුරකථන මත පදනම් වූ රූපවාහිනී විකාශන මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම සඳහා අවසර ඉල්ලා සිටින යම් අයදුම්කරුවකු විසින් -

(i) විකාශනය සිදුවිය යුත්තේ යම් පදනමක් මත ද එම පදනමට අනුරූපී ලෙස අන්තර්ජාල සේවා පහසුකම් සපයන්නකු ලෙස හෝ දුරකථන ජාලයක් වශයෙන් ජාලයක් පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වැනි වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් හිමිව සිටිය යුතුය; නැතහොත්

(ii) එවැනි රූපවාහිනී විකාශන මෙහෙයුමක් පිහිටුවීම හෝ පවත්වාගෙන යෑම සඳහා අවශ්‍ය වන එවැනි ජාල පහසුකම් භාවිතය සඳහා, ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වැනි වගන්තියේ (i) වැනි ඡේදයේ උචිත විස්තරය ප්‍රකාරව යම් බලපත්‍රලාභී මෙහෙයුම්කරුවකු සමග යථාපරිදි ගිවිසුමකට ඇතුලත් ව සිටිය යුතුය.

### මූල්‍ය

5. සෑම ඉල්ලීමක්ම ආපසු ගෙවනු නොලබන රු. 100,000 ක ගාස්තුවක් ද සමග ඉදිරිපත් කළ යුතුය.

6. අයදුම්කරු විසින් ආයතනයේ යෝජිත මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය, ආයතනයේ මූල්‍ය තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

7. අයදුම්කරු විසින් ආයෝජන සැලැස්ම හෝ වාර්ෂික වාර්තාව අමාත්‍යංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

### වෘත්තීමය

8. අයදුම්කරු විසින් යෝජිත මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන පුද්ගලයන්ගේ වෘත්තීමය සුදුසුකම් හා හැකියාවන් පිළිබඳ විස්තර ඉදිරිපත් කළ යුතුය.

9. අයදුම්කරු සමාගමක් වන අවස්ථාවක, එකී සමාගම විසින් සමාගමේ සියලු අධ්‍යක්ෂවරුන්ගේ නම් හා විස්තර සපයනු ලැබිය යුතුය.

ඒ අනුව වර්ෂ 2008.10.10 සහ අංක 1570/35 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය යටතේ නිකුත් කරන ලද 2007 පෞද්ගලික රූපවාහිනී විකාශන මධ්‍යස්ථාන නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

10. මෙම නියෝගවල-

"පනත" , යන්නෙන් 1982 අංක 6 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත අදහස් වේ;

"අන්තර්ජාල සේවා සැපයුම් ජාලය - (ISP)" , යන්නෙන්, ග්‍රාහකයන් වෙත අන්තර්ජාල ප්‍රවේශ පහසුකම් සැපයීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් යථා පරිදි නිකුත් කරන ලද බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති තැනැත්තකු විසින් ක්‍රියාත්මක කරනු ලබන යම් පද්ධතියක් අදහස් වේ;

"තැනැත්තකු" , යන්නෙන් ස්වාභාවික හෝ නෛතික පුද්ගලයකු අදහස් වේ;

"ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව" , යන්නෙන් 1982 අංක 6 දරන ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථා පනත මගින් පිහිටවනු ලැබූ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව අදහස් වේ;

"ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව" , යන්නෙන් 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත මගින් පිහිටවනු ලැබූ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අදහස් වේ.

"දුරකථන ජාලය" , යන්නෙන්, විදුලි සංදේශ පහසුකම් සැපයීමේ හැකියාව ඇති විදුලි සංදේශ පද්ධතියක් අදහස් වේ;

"අමාත්‍යවරයා" , යන්නෙන් ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යවරයා අදහස් වේ;

"ලේකම්" , යන්නෙන් ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යංශයේ ලේකම් අදහස් වේ;

"ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත" , යන්නෙන් 1991 අංක 25 දරන පනත අදහස් වේ.

09-867

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.